# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2265/36 – 2022 පෙබරවාරි 02 වැනි බදාදා – 2022.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/K/2015/61.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.01.26 දිනැති හා අංක 2212/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පාදුක්ක, බටවල, අංක 13/2,හි පදිංචි චමිල් ප්‍රියන්ත සමරධීර මයා සහ කොළඹ 05, නාරාහේන්පිට ,ඇල්විටිගල මාවත, අංක 354/2, ''නිපුණතා පියස'', 4 වන මහල හි පිහිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.12.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජනවාරි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

IR/COM/01/K/2015/01

කාර්මික අධිකරණයේ දී ය

චමිල් ප්‍රියන්ත සමරධීර මයා,
අංක 13/2, බටවල,
පාදුක්ක.

පළමුවැනි පාර්ශවය

සහ

නඩු අංකය: A/03/2021

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
04 වන මහල,
''නිපුණතා පියස'',
අංක 354/2.
ඇල්විටිගල මාවත.
නාරාහේන්පිට.
කොළඹ 05.

දෙවන පාර්ශවය

අතර පවතින කාර්මික ආරවුල

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරණ පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිවය යටතේ කම්කරු හා කම්කරු සබදිතා අමාත්‍යාංශයට පැවරී ඇති බල තල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2021-01-01 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

මීට පෙර මෙම ආරවුල බේරුම් කිරීමෙන් සමතයකට පත් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් පත් කර තිබූ H.M .අනුලාවති මෙනවියගේ 2020-10-20 දිනැති පත් කිරීමේ නියෝගය 2021-01-01 දින කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද මැතිතුමාගේ නියෝගයෙන් අවලංගු කිරීමක් සිදු කර ඇත.

ඉහත ඇමතිවරයාගේ පත් කිරීම ප්‍රකාරව බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කිරීමෙන් අනතුරුව එකී A63/2019 නඩු කෘත්‍යම නැවත A03/2021 යටතේ විමර්ශනය ආරම්භ කර ඇත.

**ආරවුලට හේතු වී ඇති කාරණය -**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ:-
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරි වශයෙන් සේවය කරමින් සිටින චමිල් ප්‍රියන්ත සමරධීර මහතාට 2012-06-18 දිනැතිව ලබා දුන් පත්වීම් ලිපිය ප්‍රකාරව පුහුණු කළමණාකරු තනතුර ලබා නොදී අදාල වැටුප් තලයෙන් පිහිටුවා නොතිබීම තුළින් අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.

**පසුබිම**

මෙම ආරවුල සඳහා පළමුවෙන් පත්කර තිබූ බේරුම්කරු ඉදිරියේ නඩු අංක A 63/2019 යටතේ පළමු පාර්ශවය 2019-07-26 වන දින පළමු විස්තර ප්‍රකාශය X-01 සිට X-04 දක්වා ඇමිණුම් සහිතවද, දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 2019-08-20 වන දින ඉල්ලුම්කාර පාර්ශවයේ ඉල්ලීම සම්බන්ධයෙන් තම ස්ථාවරය ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශවය දෙවන ප්‍රකාශය 2019-10-07 වන දින ඉදිරිපත් කර ඇති අතර වගඋත්තරකාර දෙවන පාර්ශවයේ පිළිතුරු ප්‍රකාශය 2019-10-17 වන දින ඉහත A 63/2019 දරන නඩු අංකය යටතේ ඉදිරිපත් කර ඇත.

දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 2019-08-20 වන දින ඉල්ලුම්කාර පාර්ශවයේ ඉල්ලීම සම්බන්ධයෙන් තම ස්ථාවරය ඉදිරිපත් කරමින් ආරවුලට අදල X-04 දරන පත්වීම් ලිපිය ප්‍රතික්ෂේප කරන බවත් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2/1/6/10/9 දරන හා 2012-08-20 දිනැති ලිපිය මගින් අභ්‍යන්තර උසස්වීම් ලබා දීම සියල්ලටයම අත්හිටුවීමේ නියෝගයක් කළ බව දක්වා ඇත.

පළමු පාර්ශවය 2019-10-07 වන දින දෙවන ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ඉහත 2021-08-20 දිනැති 2/1/6/10/9 දරණ උසස් වීම් අත්හිටු වීම් කොටසකට පමණක් සීමා වන බවත් එමගින් තමන්ට අගතියක් සිදුවන බවත්, X 04 දරණ පුහුණු කළමණාකර තනතුරට උසස් කළ පත්වීම තාමත් වලංගු බවට ස්ථාවරයක් ගෙන ඇත.

2019-10-17 වන දින වගඋත්තරකාර දෙවන පාර්ශවය විසින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් නැවත පිළිතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් 2011-11-21 වන දින අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 151/04 මගින් සහකාර අධ්‍යක්ෂක තනතුරේ වැඩ බැලීමට පත් කර සිටි දෙදෙනෙකු අධ්‍යක්ෂක මණ්ඩල නියෝගයක් මත අභ්‍යන්තර උසස්වීම් ලබා දී ඇති නමුත් ඉන් පසුව කිසිදු පත් කිරීමක් සිදු කර නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

තවද ඉල්ලුම්කාර චමල් ප්‍රියන්ත සමරධීර නැමති අය වගඋත්තරකාර අධිකාරියේ උසස් වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වූ කාල වකවානුවේදී "පත්කිරීම් සම්බන්ධ විෂයභාරව කටයුතු කල නිලධාරියා" බවත් X- 04 දරන ප්‍රශ්නගත පත්වීම් ලිපිය වගඋත්තරකාර ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් විධිමත් ලෙස ලබා දුන් එකක් නොවන බවත් එම ලිපියේ කිසිදු වලංගුභාවයක් නොමැති බවට කරුණු දක්වමින් එම ලේඛනය අභියෝගයට ලක් කර ඇත. එසේම වගඋත්තරකරු තවදුරටත් කරුණු දක්වමින් X- 04 දරන පත්වීම් ලිපිය අනුව රාජකාරිය භාර ගැනීමක් සිදු නොවීම. එම පත්කිරීම විධිමත් එකක් නම් පිටපත් විගණකාධිපති වෙත, මුදල් සැලසුම් පුහුණු හා ප්‍රධාන අභ්‍යන්තර විගණන වෙත යොමු නොවීම හා එම ප්‍රශ්ණගත පත්වීම් ලිපියේ පිටපත් ඉහත කී කිසිදු අංශයක් වෙත ලැබී නොමැති බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා විය යුතු බවට කරුණු දක්වා ඇත. එසේම වගඋත්තර පාර්ශවය කරුණු දක්වා ඇත්තේ මෙම පැමිණිල්ල ඇමුණුම් 2 හෙවත් A2 දරන 2012-08-20 වන දිනැති යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසු බවට අනුමැතිය ලබා ඇති සියලු බඳවා ගැනීම් වහාම අත්හිටුවීමේ නියෝගය නිකුත් කර ඇති බැවින් පළමු පාර්ශවයේ ඉල්ලීම නිශ්ප්‍රභා විය යුතු බවට තව දුරටත් කරුණු දක්වා ඇත.

මෙම නඩුව 2021-02-01 වන දින මා ඉදිරිපිට විභාගයට ගත් අවස්ථාවේදී ඉහත කී A63/2019 නඩු ගොනුවම නැවත මා ඉදිරියේදී A03/2021 දරන නඩු අංකය යටතේ දෙපාර්ශවයේ එකඟතාවය මත නඩු කටයුතු ආරම්භ වූ අතර එදින ඉල්ලුම්කාර පාර්ශවය හා වගඋත්තරකාර පාර්ශවය නීතිඥ නියෝජනයක් සහිතව මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් දෙපාර්ශවයට පිටපත් සහිතව ඉදිරිපත් කිරීමට අවසර ඇයද ඇත.

එසේම එදින වගඋත්තරකාර පාර්ශවය විසින් ආර් සුනිල් නැමති නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ප්‍රකාශ කර සිටියේ X1 සිට X4 දක්වා ලේඛණ ඔහු භාරයේ ඇති බවත් X1 සිට X3 දක්වා ලේඛණ පිලිගන්නා බවත් X4 දරණ ලේඛණය පිලිනොගන්නා බවත් සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දීමේ ක්‍රමවේද වල විනිවිදභාවයක් නොමැති වීම නිසා විවිධ පාර්ශවයන් විසින් අමාත්‍යාංශයට පැමිණිලි කිරීම හේතුවෙන් අමාත්‍යාංශ ලේකම් විසින් 2012-08-20 ලිපිය මගින් සියළුම බඳවා ගැනීම් අත්හිටුවීමක් කල බවයි. මා විසින් ඉල්ලුම්කාර පාර්ශවයෙන් ආරවුල් සහගත X4 දරන පත්වීම අනුව ප්‍රශ්න කරන ලදි.

2021/02/01 සාක්ෂි සටහන් 4 පිටුව
අධිකරණය විසින් ඉල්ලුම්කාර පාර්ශවයෙන් ප්‍රශ්න කිරීමේදී

ප්‍ර - X 4 අනුව කිසිම පත් කිරීමක් භාරගත්තේ නෑ.
උ - නැහැ, අපි පත්වීම භාර ගන්න ගියා. එවකට සිටි අධ්‍යක්ෂ පාලනතුමිය කිව්වේ පොඩ්ඩක් ඉන්න පොඩ්ඩක් ඉන්න කියලා.
ප්‍ර- මේ X 4 ලේඛණය සම්බන්ධයෙන් මේ අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මෙය අත්හිටෙව්වා කියා පිළිගන්නවාද
උ- ලේඛණයක් ඉදිරිපත් කළා. කම්කරු කොමසාරිස්තුමා මේ පරීක්ෂණයක් පවත්වන කොට මේ පත්වීම අත්හිටුවීම කළා කියලා ලේඛණයක් ඉදිරිපත් කළා.

එකී ලේඛණය ඇමුණුම් 2 වශයෙන් පලමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් 2021- 02- 08 වන දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් 2021-02-08 වන දින මෙම ආරවුල සම්බන්ධයෙන් මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කරමින් තමන් විසින් 2019-07-26 වන දින පලමු සවිස්තර ප්‍රකාශය සමග X01 සිට X04 දක්වා ලේඛණ ගොණු කර ඇති බවත් එදින ඔහු විසින් ඉදිරිපත් කරන ලද X 04 දරන ලේඛණය විධිමත්ව ඔහු වෙත නිකුත් කරන ලද ලේඛණයක් බවත් ඇමුණුම් 1. ඇමුණුම් 2, ඇමුණුම් 3, වශයෙන් ලේඛණ ඉදිරිපත් කරමින් චන්දි කුලතුංග සහ මනම්පේරිය යන අයට පත්වීම් ලබා දී ඇති බවත් එබැවින් ඔහුටද X 04 පත්වීම් ලිපිය අනුව වැටුප් හා දීමනා ගෙවිය යුතු බවට වැඩි දුරටත් කරුණු දක්වා ඇත.

එසේම වර්ෂ 2021-02-08 වන දින වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම නඩුවේ තම ස්ථාවරය දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරමින් ව - 01, ව- 02, ව - 03, ව - 03(1), ව - 04, ව - 05, ව - 05 (i) ව - 5 (ii), ව - 6, ව - 07, ව - 07 (i), ව - 07 (ii), ව - 07 (iii), ව - 07 (iv), ව - 07 (v), ව - 08, ව - 08 (i), ව - 09,ව- 09 (i), දරන ලේඛණ ඉදිරිපත් කරමින් X 04 දරණ ප්‍රශ්නගත පත්වීම් ලිපිය වගඋත්තරකාර වෘත්තීය පුහුණු අධිකාරිය විසින් නිකුත් කල පත්වීම් ලිපියක් නොවන බවත් එය අභියෝගයට ලක් කරන බවත් ප්‍රකාශ කර ඇත.

X-01 හෙවත් ව 01 දරන ලේඛණය ඉල්ලුම්කරුගේ පළමු පත්වීමේ ලිපිය වන අතර එහි දිනය වන්නේ 1997-06-23 වේ. X-03 වශයෙන් ඉදිරිපත් කර ඇති (ජෞෂ්ඨ වැඩසටහන් නිලධාරි (ii වන ශ්‍රේණිය) තනතුරට පත් කිරීමේ ලිපිය වගඋත්තරකාර පාර්ශවය ව 4 ලෙස සලකුණු කර ඇත.

පළමු පාර්ශවය විසින් ගරු අධිකරණයෙන් ඇයද සිටින මූලික සහනය වන X- 04 ලේඛණය අනුව පුහුණු කළමණාකාර තනතුරට උසස් කළ 2012-06-19 වන දින සිට එම තනතුරේ විදිමත් ලෙස පිහිටුවීමේ සහනයක අයදිමින් සිටියදී නැවත X-03 හෙවත් ව-04 දරන ලේඛණය ප්‍රකාරව ඉල්ලුම්කරු 2015-01-12 වන දින ජෞෂ්ඨ වැඩබලන නිලධාරි තනතුරට නව පත්වීමක් ලබා ඇත. එම නව පත්වීම අනුව ව 05, ව 5(1) අනුව ඉල්ලුම්කරු නව පත්වීම භාරගෙන ඇත. ව5 (ii) මගින් අවනතභාවය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඥවක්ද ලබා දී ඇත.

එසේම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් ව-6 සිට ව-09(i) දක්වා ලේඛන මගින් ඉල්ලුම්කරු x - 03 එනම් ව - 04 දරණ නව පත්වීම අනුව ව - 05 දරන ලේඛණය අනුව රාජකාරියට වාර්තා කොට දිවුරුම් දීමෙන් රාජකාරි පැවරුම් ලබා ගනිමින් වැටුප් වර්ධක ලබා ගනිමින් සේවා සහතික ලබා ගනිමින් රාජකාරි කටයුතුවල නියැලී ඇත.

මා ඉදිරියේදී 2021.02.15 වන ඉල්ලුම්කරු සාක්ෂියට කැඳවා ඇති අතර ඉල්ලුම්කරු විසින් 2021.02.08 වන දින දිවුරුම් ප්‍රකාශ සමග ඉදිරිපත් කරන ලද ඇමිණුම් 1 ලේඛණය A- 01 වශයෙන්ද, ඇමුණුම් 02, A- 02 වශයෙන් ද ඇමුණුම් 03, A- 03 ලෙස සලකුණු කොට ඇත. A- 03 දරන ලේඛණය P.R.M.C කුලතුංග නැමැත්තියගේ 2012-05-03 දින සිට තනතුර උසස් කිරීමේ ලිපියකි. X-2 දරන ලේඛණය පුහුණු කලමනාකරු තනතුරේ රාජකාරි ආවරණය කිරීමක් වන අතර වගඋත්තරකරු හරස් ප්‍රශ්න වලදී යෝජනා කර ඇත්තේ එකී ලේඛණය මුල් ගොනුවේ නොමැති ලේඛණයක් බවයි.

ඉල්ලුම්කාර පාර්ශවය හරස් ප්‍රශ්න හා නැවත ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව X-01 සිට X-04 දක්වා ලේඛණ ලකුණු කරමින් 2021-02-15 වන දින තම නඩුව අවසන් කර ඇත.

ඉන් අනතුරුව මා විසින් ඒ 2 දරණ 2012-08-20 වන දිනැති බඳවා ගැනීම් අත්හිටුවීම ගැන වගඋත්තරකරුගෙන් ප්‍රශ්න කළ අතර එකී ලේඛණය ගැන දනුවත් බවත් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලේඛණයක් බව පිළිගන්නට යෙදුණි. එදින පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුගෙන් ඇමුණුම් 2 සම්බන්ධයෙන් මා ප්‍රශ්න කිරීමේ දී මෙසේ පිළිතුරු ලබා දී ඇත.

<u>2021/02/15 සාක්ෂි සටහන් 13 පිටුව</u>
අධිකරණය විසින් වගඋත්තරකරුගෙන් ප්‍රශ්න කිරීමේදී

ප්‍ර - ඇමුණුම් 2 පිළිගන්නවාද? සාක්ෂිකරු එකී ලේඛණය ලැබුණේ කවද්ද
උ - මේක මට දුන්නේ ගරු අධිකරණයට ආයතනයෙන් ඉදිරිපත් කරපු ලියුමක්. මේ ලිපියෙන් මගේ පත්වීම අහෝසි කරා කියලා මුල් අවස්ථාවේදී නඩුව අහනකොට ආයතනයෙන් ඉදිරිපත් කරා කම්කරු දෙපාර්තමේන්තුවට.

A 2 දරණ ලේඛණයේ නිත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් සහ වගඋත්තරකරුට ලේඛණගත සාක්ෂි ඉදිරිපත් කිරීමට නියෝගයක් කළ අතර වගඋත්තරකරු විසින් 2021-03-16 වන දිනැති ලේඛණයක් ඉදිරිපත් කර ඇති අතර ව 10.ව 11. ව12. ව12(1). ව 12 (2). ව 12(3). දරණ ලේඛණ ඉදිරිපත් කරන ලදී. ව 10 ලේඛණ අභ්‍යන්තර උසස්වීම් ලබා දීමට ඉදිරිපත් කරන ලද ලේඛණයක් බවත් ව 11 සියලු බඳවාගැනීම් අත්හිටුවීම සඳහා අමාත්‍යාංශ ලේකම් නිකුත් කරන ලද ලේඛණයකි. එකී ලේඛණය ඉල්ලුම්කරු විසින් ඇමිණුම් 2 හෙවත් A-2 වශයෙන් ඉදිරිපත් කර ඇත. ව 12 අමාත්‍යාංශ ලේකම්වරයාගේ බලතල දක්වෙන ලේඛණයක් වන අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ බලතල හා වගකීම් එහා සවිස්තරව දක්වා ඇත. එම ලේඛණ ඉදිරිපත් කරමින් වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටියේ අමාත්‍යාංශ ලේකම් විසින් තම නිත්‍යානුකූල බලතල තුල සිටිමින් A 2 හෙවත් ව 11 මගින් සම්මුඛ පරීක්ෂණය මගින් තෝරා පත්කරගනු ලැබූ බඳවා ගැනීම් අත්හිටවූ බවයි.

වගඋත්තරකාර පාර්ශවයේ මූලික සාක්ෂි 2021-03-16 වන දින රත්නායක සුනිල් යන අය සාක්ෂි ලබා දෙමින් ව - 01 සිට ව-11 දක්වා ලේඛණ ලකුණු කරන ලදී. ව - 1 සිට ව - 11 දක්වා ලේඛණ ඉල්ලුම්කරුට ලැබුණු බවත් ව - 8 සහ ව - 9 ලේඛණ හබ නොකරන බවත් අත්සන පිළිගන්නා බවත් ව - 1 සිට ව - 6 දක්වා ලේඛණ පළමු පාර්ශවය පිළිගන්නා බවත් මා ඉදිරියේදී ප්‍රකාශ කරන ලදී.

ඔහු තවදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන්නට යෙදුණේ ව10 දරන ලේඛණයේ ඉල්ලුම්කාර C.P සමරධීර යන අයගේ නම සඳහන් වුත් කිසිවෙකුට පත්වීම් ලබා දී නොමැති බවත් ව-11 ලේඛණය මගින් සම්මුඛ පරීක්ෂණයේ අර්බුදකාරි තත්වයක් මත අමාත්‍යාංශ ලේකම් විසින් පත්වීම් ලබා දීම් අහෝසි කරන ලද බව සඳහන් කරන්නට යෙදුණි. X-4 ලිපි ගොණුවේ පිටපතක් පුද්ගලික ලිපි ගොනුවට ඇතුලත් වී නොමැති බවට සාක්ෂි ලබා දී ඇත.

ඉහත කී සාක්ෂිකරු 2021-04-07 වන දින හරස් ප්‍රශ්න වලට භාජනය වූ අතර X-4 දරන ප්‍රශ්නගත ලිපිය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසන ලද බවත් එවැනි ලිපියක් ආයතනය මගින් නිකුත් කර නොමැති බවත් නැවත ප්‍රශ්නවලදී ඔහු සඳහන් කරන්නට යෙදුණේ නිකුත් නොකරන ලද ලේඛණයක් අවලංගු කිරීමට අවශ්‍ය නොවන බවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ පුහුණු කළමණාකාර තනතුර සඳහා 13 දෙනෙකු පත් කරනු ලැබූ නමුත් කිසිවෙකුටත් පත්වීම් ලබා දී නොමැති බවට ඔහු තව දුරටත් සාක්ෂි ලබා දී ඇත.

2021-04-07 වන දින හරස් ප්‍රශ්න හා නැවත ප්‍රශ්න ඇසීමෙන් පසු ව - 1 සිට ව - 12 දක්වා ලේඛණ ඉදිරිපත් කරමින් වගඋත්තරකරු තම නඩුව අවසන් කර ඇත.

ඉන් අනතුරුව දෙපාර්ශවය විසින් 2021-04-23 වන දින ලිඛිත දේශන ඉදිරිපත් කර ඇති අතර වගඋත්තරකරු විසින් Y-1 වශයෙන් ලේඛණයක් ඉදිරිපත් කර ඇත. එම ලේඛණය අනුව සියලු බඳවා ගැනීම් අත්හිටුවීම සඳහා අත්සනට ඉදිරිපත් කිරීමේ සටහනේ සහතික පිටපතක් බව නිරීක්ෂණය වේ.

මෙම නඩුවේ විශේෂයෙන් සලකා බැලිය යුතු වන්නේ 4 දරන ලේඛණය වගඋත්තරකාර වෘත්තීය පුහුණු අධිකාරිය විසින් නිකුත් කරන ලද්දක් ද නැද්ද යන්නයි. ඇමුණුම් 1 හෙවත් A-1 දරන ලේඛණය ඉදිරිපත් කර ඇත්තේ සුනිල් අබේසිංහ නැමැත්තෙක් වන අතර එහි දිනයක් සඳහන් කර නැත. ඔහු සාක්ෂියට කැඳවා නැත. මුල් පිටපත භාරගන්නා දිනය වශයෙන් 2013-01-04 යනුවෙන් සටහනක් ඇත. ඉල්ලුම්කරු ඇතුලු තවත් තිදෙනෙකුගේ නම් සඳහන්ව ඇත. ඉල්ලුම්කරු විසින්ම ඉදිරිපත් කර ඇති A-2 දරණ ලේඛණය මගින් බඳවා ගැනීම් අත්හිටුවීම පිළිගෙන ඇත. එසේම ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති X-3 මගින් 2015-01-12 වන දින සිට ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරි (ii වන ශ්‍රේණිය) තනතුරක් ඉල්ලුම්කරු විසින් භාරගෙන ඇත.

එසේම වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති ස්ථාවරය සහ ව-1 සිට ව-12 දක්වා ලේඛණ අභියෝගයට ලක් කිරීමට ඉල්ලුම්කරු අසමත්ව ඇත. ඉල්ලුම්කරු සාක්ෂි කැඳවීමෙන් හෝ ප්‍රමාණවත් ලේඛණගත සාක්ෂි ඉදිරිපත් කිරීමෙක් ප්‍රශ්නගත X-4 දරණ ලේඛණය වලංගු ලේඛණයක් බවට සනාථ කිරීමට අසමත්ව ඇත.

සාධාරණ සහ යුක්තිසහගත සංකල්පය මත පිහිටා මෙම නඩුවේ ඉදිරිපත් වූ සාක්ෂි සහ ලේඛණගත සාක්ෂි පරිශීලනය කිරීමේදී ඉල්ලුම්කාර පළවන පාර්ශවය ඉදිරිපත් කර ඇති X - 4 දරන ලේඛණය වගඋත්තරකාර ආයතනය විසින් නිකුත් නොකරන ලද්දක් බවත් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති A - 2 සහ X - 3 දරන ලේඛණ මගින් ප්‍රශ්නගත X-4 දරන පත්වීම් ලිපියේ වලංගුතාවයක් නොමැති බව අනියම් ආකාරයෙන් ඉල්ලුම්කරු පිළිගෙන ඇති බවක් නිරීක්ෂණය වේ. එසේම X-2 දරන පත්වීම් අත්හිටුවීමට එරෙහිව ඉල්ලුම්කරු කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් නොගෙන X-3 දරන නව පත්වීමත් භාර ගැනීම තුලින්ම ඉල්ලුම්කරුගේ සාක්ෂි විශ්වාස කිරීමට සුදුසු නොවන බව මා නිගමනය කරමි.

සාධාරණ සහ යුක්ති සහගත නියෝගයක් ලබා දීමේදී සාක්ෂි ආඥා පනතේ විධිවිධානවලින් බැඳී නැති වුවද ඉදිරිපත් වූ වැදගත් කරුණු අධිකරණමය ආකාරයෙන් තුලනය කිරීමට විනිශ්චය සභාවන් බැඳී සිටින බව පිළිගත් නීතිමය තත්වයයි.

නාකියාකන්ද සමූහය එදිරිව ලංකා වතු කම්කරුවන්ගේ සංගමය (1969-77) CLW 52 නඩුවේදී ගරු විනිසුරු ද ක්‍රෙස්ටර් පවසා සිටියේ සමාජ නීතිකරණයේ අරමුණ වන්නේ තෘප්තියට පත් සේවකයකුවීම පමණක් නොව තෘප්තියට පත් සේවා යෝජකයෙකු වීමද බැවින් සාධාරණ සහ යුක්ති සහගත නියෝගයකදී සේවකයාගේ වාසිය පමණක්ම නොව සේවා යෝජකයාගේ සහ රටේ යහපත ගැනද සැළකිලිමත්වීම වැදගත් බවය.

ඉහත සඳහන් කරන ලද හේතු මත ඉල්ලුම්කාර පළමු පාර්ශවයේ ඉල්ලීම නිශ්ප්‍රභා කිරීමට මා තීරණය කරමි.

### ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරණ පනත්වලින් සංශෝධිතවූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2021-01-01 දිනැති නියෝගයෙන් මා වෙත යොමු කර ඇති යොමුව සම්බන්ධයෙන් කාර්මික ආරාවුලට අදාල ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරී වශයෙන් සේවය කරන ඉල්ලුම්කාර චමිල් ප්‍රියන්ත සමරධීරගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි.

මෙය යුක්ති සහගත හා සාධාරණ තීරණයක් බව මාගේ හැඟීමයි.

**ඩබ්ලිව්. එම්. එස්. ඩී වීරකෝන්,**
බේරුම්කරු.

2021 දෙසැම්බර් මස 24 වැනි දින,

EOG 01-0371